# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,996 - 2016 දෙසැම්බර් මස 02 වැනි සිකුරාදා - 2016.12.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1358 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 1361 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1368 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* - ශ්‍රී ලංකා ජාත්‍යන්තර නේවර් ලවින් සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 ඔක්තෝබර් මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) දේශයේ පාරිසරික පර්ෂදය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 නොවැම්බර් මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) දිවි නැගුම (සංශෝධන) පනත් කෙටුම්පත 2016 නොවැම්බර් මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කර ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 දෙසැම්බර් මස 23 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 දෙසැම්බර් මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.''*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*).

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1357 – B 081120 —403 (2016/12)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2016 අංක 1347

MOD/DEF/21/RET/1056.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්, විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2016 අප්‍රේල් මස 04 වැනි දින සිට මේජර් ජෙනරාල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් ජෙනරාල් ජගත් චන්ද්‍රලාල් පල්ලියගේ පක්ෂවීර, ආර්එස්පී, යූඑස්පී (නි/60078)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2016 අප්‍රේල් මස 05 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් ජගත් චන්ද්‍රලාල් පල්ලියගේ පක්ෂවීර, ආර්එස්පී, යූඑස්පී (නි/60078)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2016 අප්‍රේල් මස 05 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරුකිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් ජගත් චන්ද්‍රලාල් පල්ලියගේ පක්ෂවීර, ආර්එස්පී, යූඑස්පී (නි/60078)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

12 - 54

2016 අංක 1348

MOD/DEF/2/01/ARF/RET/572.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2014 පෙබරවාරි මස 28 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් දිලන්ත චමින්ද අල්ගම, ආර්එස්පී, ශ්‍රීලයුවෙබ (නි/65521)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2014 මාර්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් දිලන්ත චමින්ද අල්ගම, ආර්එස්පී, ශ්‍රීලයුවෙබ (නි/65521)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

12 - 53

---

2016 අංක 1349

MOD/DEF/2/01/ARF/RET/568.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2014 මැයි මස 31 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් ශාප්‍රිය මහේන්ද්‍රනාත් කුමාර සුරවීරආරච්චිගේ, ආර්එස්පී, ගැහේබ (නි/62701)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2014 ජුනි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ශාප්‍රිය මහේන්ද්‍රනාත් කුමාර සුරවීරආරච්චිගේ, ආර්එස්පී, ගැහේබ (නි/62701)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

12 - 178

---

2016 අංක 1350

MOD/DEF/02/01/ARF/REM/855.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 පෙබරවාරි මස 27 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් ඇල්ලලහේවාගේ දෙන් සිසිල් චන්දිම හේවගේ, ආර්එස්පී, ශ්‍රීලංසිරෙ (නි/65457)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 පෙබරවාරි මස 28 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ඇල්ලලහේවාගේ දෙන් සිසිල් චන්දිම හේවගේ, ආර්එස්පී, ශ්‍රීලංසිරෙ (නි/65457)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජුනි මස 06 වැනි දින,
කොළඹ දී ය.

12 - 52

---

2016 අංක 1351

MOD/DEF/2/01/ARF/RET/1071.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 නොවැම්බර් මස 23 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් දෙන් මොහාන් දුලත් දිනේෂ් මාධව වලාකුලුගේ, ආර්එස්පී, ගරෙ (නි/66006)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 නොවැම්බර් මස 24 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් දෙන් මොහාන් දුලත් දිනේෂ් මාධව වලාකුලුගේ, ආර්එස්පී, ගරෙ (නි/66006)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 මාර්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

12 - 57

---

2016 අංක 1352

MOD/DEF/2/01/ARF/RET/920.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 ඔක්තෝබර් මස 13 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන්

විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් හංගිලි ගෙදර නිහාල් ආනන්ද, ශ්‍රීලයුයුබ (නි/64144)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

12 - 55

---

2016 අංක 1353

MOD/DEF/2/01/ARF/RET/830.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 මැයි මස 19 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් (උපකරණ පාලක) සියඹලාගහ ගෙදර නිහාල් වික්‍රමසිංහ, ශ්‍රීලංසිරෙ (නි/69230)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මැයි මස 07 වැනි දින,
කොළඹ දී ය.

12 - 56

---

2016 අංක 1354

MOD/DEF/2/01/ARF/RET/1072/A.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවේ පහත නම සඳහන් නිලධාරි 2016 මාර්තු මස 05 වැනි දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් ජාලත් තන්ත්‍රිගේ චමිත් අසංක තන්ත්‍රිගේ, ගැහේබ (නි/68924)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 මාර්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

12 - 177

---

2016 අංක 1355

MOD/DEF/03/02/RNF/COM/I.

**ශ්‍රී ලංකා නාවික හමුදව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම්

*2016 ජූලි මස 30 වැනි දින සිට වැඩ බලන උප ලුතිනන් වශයෙන් :*

1. වැඩ බලන උප ලුතිනන් (පනිසෙ෴) සූරිය විජේකෝන් ගුණවත් මුදියන්සේලාගේ සමන්ත විජේකෝන්, එන්ආර්ඩබ් 3915, ශ්‍රීලංනාහ
2. වැඩ බලන උප ලුතිනන් (පනිසෙ෴) සොලන් ආරච්චිගේ අජිත් පතිරණ, එන්ආර්ඩබ් 3916, ශ්‍රීලංනාහ
3. වැඩ බලන උප ලුතිනන් (නැකා) පිටිගල ආරච්චිලාගේ සමන් කුමාර, එන්ආර්එච් 3917, ශ්‍රීලංනාහ
4. වැඩ බලන උප ලුතිනන් (පනිසෙ෴) මානික්ක්‍රම් පේඩිගේ තිලක් උපුල් කුමාර, එන්ආර්ඩබ් 3918, ශ්‍රීලංනාහ
5. වැඩ බලන උප ලුතිනන් (වි) මොරපිටියගේ කසුන් ලක්ෂිත මොරපිටිය, එන්ආර්එල් 3919, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 ඔක්තෝබර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

12 - 51

2016 අංක 1356

D/AF/650.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම

2009 ඔක්තෝබර් මස 27 වැනි දින සිට පහත නම් සඳහන් අයවලුන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර්වරුන් වශයෙන් අධිකාරියට පත් කිරීමටත්, එදිනම සිටම ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් ඇති ශාඛාවන්ට ඇතුළත් කිරීමටත් අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළකොට ඇත.

පයිලට් ඔෆිසර් වෙදයාලගේ මංජුල ක්‍රිෂාන්ත වෙදගේ (02793) විද්‍යුත්/ඉංජි
පයිලට් ඔෆිසර් දිසානායක මුදියන්සේලාගේ ලක්ෂ්මන් ගුණසිරි ජයසේන (02794) විද්‍යුත්/ඉංජි
පයිලට් ඔෆිසර් මීගස්වත්තේ දිසානායක මුදියන්සේලාගේ රවින්ද්‍ර උදය බණ්ඩාර දිසානායක (02795) විද්‍යුත්/ඉංජි
පයිලට් ඔෆිසර් කදිරේසන් මෝහන චන්ද්‍රප්‍රකාශ් (02796) විද්‍යුත්/ඉංජි

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2010 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ දී ය.

12 - 179

---

# රජයේ නිවේදන

එප් (2) 2/64.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *අංකය* | *ලියාපදිංචි කිරීමේ දිනය* | *විස්තරය* | *පිහිටීම* | *දේවගැති තැන අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද* |
|---|---|---|---|---|---|
| 1492 | 2016.11.01 | ශාන්ත අන්තෝනි දේවස්ථානය | ඔපාත, මිණුවන්ගොඩ. | ගරු ශ්‍රියානන්ද ප්‍රනාන්දු පියතුමා | රෝමානු කතෝලික |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 නොවැම්බර් මස 11 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

12 - 59/1

(එප් 2) 2/64.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ගොඩනැගිල්ල ලියාපදිංචි කිරීමේ සහතිකය

සහතික අංකය : 1492

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තිය යටතේ කරන ලද ඉල්ලීම ප්‍රකාශය අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත විස්තර කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව සහතික කරමි.

| *විස්තර* | *පිහිටීම* | | *දිස්ත්‍රික්කය* | *දේවගැති තැන අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද* |
|---|---|---|---|---|---|
| | *ගම හෝ වීථිය සහ නගර කොට්ඨාසය* | *පත්තුව, කෝරළය හෝ දිස්ත්‍රික්කයේ වෙනත් කොට්ඨාසය* | | | |
| ශාන්ත අන්තෝනි දේවස්ථානය | ඕපාත, මිණුවන්ගොඩ | උතුරු අළුත්කුරු කෝරළය | ගම්පහ | ගරු ශ්‍රියානන්ද ප්‍රනාන්දු පියතුමා | රෝමානු කතෝලික |

වර්ෂ 2016ක් වූ නොවැම්බර් මස 11 වැනි දින බත්තරමුල්ලේ දී මගේ අත්සන තබන ලදී.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

12 - 59/2

---

## සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

### කලාකරුවන් සඳහා වූ දයකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත කලාකරු දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සම්බන්ධයෙනි. ශ්‍රී ලාංකේය කලා ක්ෂේත්‍රයෙහි පෝෂණය උදෙසා සිය දායකත්වය ලබාදුන් කලාකරුවන් සඳහා සමාජ සුරක්ෂිතතාවයක් ලබාදීමේ අරමුණින් 2016 අයවැය යෝජනා ප්‍රකාරව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සහ සමාජ ආරක්ෂණ මණ්ඩලය එක්ව කලාකරුවන් සඳහා වූ දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ආරම්භ කරනු ලැබේ. මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා රජය විසින් මූලික දයකත්වය සපයනු ලබන අතර, දායකයා විසින් ඉතිරි දායකත්වය දැරිය යුතු ය. මෙම යෝජනා ක්‍රමයට අදළව අයදුම්කරුවන් බඳවා ගැනීමේ පටිපාටිය හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය පහත පරිදි වේ.

01. අවශ්‍ය සුදුසුකම් :

1.1 ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.

1.2 වයස අවුරුදු 23 ත් 55 ත් අතර කලාකරුවන්ට මේ සඳහා දායක විය හැකි අතර, වයස අවුරුදු 60 ඉක්ම වූ පසු මෙහි ප්‍රතිලාභීන් බවට පත් වේ.

1.3 කලාකරුවෙකු බවට සංස්කෘතික නිලධාරි විසින් සහතික කොට ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් මගින් නිර්දේශය ලබා තිබීම. (නාට්‍යකරණය හා රංග කලා ශිල්පය, මූර්තිකරණය, ගායන ශිල්පය, චිත්‍ර ශිල්පය, කැටයම් කලාව, බෙර වාදනය, සංගීත භාණ්ඩ වාදනය, විවිධ නර්තන කලා, සිනමා කලා, සාම්ප්‍රදයික ශාන්ති කර්ම, විවිධ සැරසිලි කලා, තොරණ කලාව, ග්‍රන්ථකරණය හා ලේඛන කලාව, සාහිත්‍ය හා රසවින්දන කලා ශිල්ප, බෙර සහ සංගීත භාණ්ඩ නිර්මාණය සහ නිෂ්පාදනය, නර්තන මෙවලම් නිෂ්පාදන ශිල්පය, රුක් කලාශිල්පය, පිටපත් රචනය

හා ගීත රචනය, තනු නිර්මාණ කලාව, සංගීත නිර්මාණය, කැමරාකරණය, පසුතල නිර්මාණ කලාව, වේෂ නිරූපන ශිල්පය, හඬ කැවීමේ ශිල්පය, රූපවාහිනී කලා ශිල්පය, වීදි නාට්‍ය ශිල්පය, නක්ෂත්‍ර සහ ජ්‍යොතිෂ්‍ය ශිල්පය යන කලා කටයුතුවල නිරතවන සහ ඒ වෙනුවෙන් සක්‍රීය ලෙස දායක වෙමින් සමාජ මෙහෙවරක යෙදෙන තැනැත්තන් "කලාකරුවා" යන අර්ථයෙහි පිහිටුවනු ලැබේ.)

1.4 කලාකරුවෙකු ලෙස පූර්වාසන්න වසර 5 ක් තුළ කලාවට සක්‍රීය දයකත්වයක් සිදුකර තිබීම.
මේ බව තහවුරුකර ගැනීම සඳහා ඔහු විසින් සිදුකළ කලා නිර්මාණයන් පිළිබඳ තොරතුරු ලබාඇති ඇගයීම් වේ නම් ඒ පිළිබඳ තොරතුරු ලබාගත යුතුය.

1.5 රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුපක් නොලබන කලාකරුවෙකු වීම.
සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල හා සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජිකත්වය දරන්නන්ට මෙම විශ්‍රාම වැටුප සඳහා අයදුම්කළ නොහැක.

02. ප්‍රතිලාභියාට වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු පළමු විශ්‍රාම වැටුප් වාරිකය ගෙවනු ලැබේ. රජයේ දායකත්වය ලෙස හිමිවන රු. 50,000.00 ට සමානුපාතිකවන මුදලක් ප්‍රතිලාභියාගේ අවසන් වාරිකවලින් හිලවු කරනු ලැබේ. මෙහි දී වයස අවුරුදු 35 ට අඩු කලාකරුවන් අනිවාර්යෙන්ම වයස අවුරුදු 60 දී මාසිකව අවම රු. 30,000.00 ක විශ්‍රාම වැටුපක් ලැබීම සඳහා දායක විය යුතුය. වයස අවුරුදු 36 සිට 55 දක්වා අයට සිය කැමැත්ත මත වයස අවුරුදු 60 දී මාසිකව රු. 3,000.00 හෝ ඊට ඉහළ අගයක් ගන්නා මාසික විශ්‍රාම වැටුපක් සඳහා දයක විය හැකිය. මෙම ක්‍රමයට දායකවන කලාකරුවන්ගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වනතුරු අදළ වාරික ගෙවිය යුතුය.

03. දයකයාට වයස අවුරුදු 60 සිට ජීවිතාන්තය දක්වා මාසික විශ්‍රාම වැටුපක් ලබා දෙනු ලැබේ.

04. දයකයා විශ්‍රාමිකයකු ලෙස අවුරුදු 80 සම්පූර්ණ වීමට පෙර මියගිය හොත්,

4.1 කලත්‍රයා ජීවත්ව සිටී නම් ඔහුට හෝ ඇයට විශ්‍රාමිකයාට වයස අවුරුදු 80 වන තෙක් විශ්‍රාම වැටුප ලබා දෙනු ලැබේ.
4.2 කලත්‍රයා නොමැති නම් දයකයාගෙන් පසු ඔහුගේ 18ට වැඩි උරුමකරුවන්ට දයකයාගේ නමින් තැන්පත්ව ඇති ශුද්ධ දයක මුදල හා පොලිය ආපසු ලබා දෙනු ලැබේ.

05. ස්ථිර අර්ධ අබලතාවයට පත්වූ විට වයස අනුව ගැලපූ පාරිතෝෂිකයක් සහ නියමිත පරිදි වාරික ගෙවනු ලැබේ.

06. ස්ථිර පූර්ණ අබලතාවයකට පත්වූ විට වයස අනුව ගැලපූ පාරිතෝෂිකය ශුද්ධ දයක මුදල සමඟ හෝ පූර්ණ අබලතාවයට පත්වූ දින සිට ජීවිතාන්තය දක්වා ගෙවනු ලබන මාසික විශ්‍රාම වැටුපක් ලබා දෙනු ලැබේ.

07. විශ්‍රාම ලැබීමට පෙර සාමාජිකයා මියගිය හොත් ඔවුන්ගේ යැපෙන්නන්ට එකවර ගෙවනු ලබන පාරිතෝෂිකයක් ලබාදෙනු ලැබේ.

08. වාරිකය ගෙවීම අතපසු වූ විට

8.1 අනුයාත වාරික 10 ක් දක්වා සහන ලබා දේ. (ඒ අතර කාලය තුළ ප්‍රමාද ගාස්තුවක් සහිතව නැවත දයක විය හැකිය.)

8.2 වාරික 10 කට වඩා ගෙවීම අතපසු වූ විට අදළ ප්‍රතිලාභියා යෝජනා ක්‍රමයෙන් ඉවත් කෙරේ.

8.3 අදළ විශ්‍රාම වැටුප වෙනුවෙන් ගෙවිය යුතු මුළු මුදලින් 25% ක් ගෙවා ඇති විට දයකයෙකුට තවදුරටත් වාරික ගෙවිය නොහැකි නම් ඒ බව දන්වා සිය ගෙවූ වාරික නැවත ලබාගත හැකිය.

8.4 ගෙවිය යුතු මුළු මුදලින් 75% ක් ගෙවා ඇති විට ගෙවා ඇති මුළු මුදලට සමානුපාතික වූ විශ්‍රාම වැටුපක් වයස අවුරුදු 60 න් පසු ලබාගත හැකිය.

09. ඉහත 8.2 හෝ 8.3 යටතේ දායකයෙකුට වාරික ගෙවීම අතපසු වූ අවස්ථාවල දී රජය විසින් දරන ලද රු. 50,000.00 ක දයකත්ව මුදල එම ප්‍රතිලාභියාට අහිමි වේ. අදළ මුදල නැවත රජය වෙත අයවිය යුතු අතර, වෙනත් සුදුසුකම්ලත් ප්‍රතිලාභියෙකුට ප්‍රතිලාභ සැළසීමට අදළ මුදල යොදගනු ලැබේ.

10. තව ද ඉහත 8.2 හා 8.3 යටතේ වරක් යෝජනා ක්‍රමයෙන් ඉවත්කරන ලද ප්‍රතිලාභියෙකු නැවත යෝජනා ක්‍රමයට බඳවා ගැනීම සිදු නොකෙරේ.

11. මෙහි ඇමුණුම 01 යටතේ දක්වා ඇති අයදුම්පත මේ සඳහා යොදගත යුතු අතර, ඒ සමග ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද අයදුම්කරුගේ උප්පැන්න සහතිකයෙහි හා ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.

මේ සමග දක්වා ඇති ඇමුණුම 02හි සඳහන් ක්‍රමය මත දායකයන් විසින් සමාජ ආරක්ෂණ මණ්ඩලය වෙත වාරික ගෙවිය යුතු අතර ඇමුණුම 03හි ඉහත 08 ඡේදයේ සඳහන් පාරිතෝෂික ගෙවීමේ ක්‍රමවේදය පිළිබඳව සඳහන් වේ.

ඉහත සඳහන් උපදෙස් ප්‍රකාරව සුදුසුකම් ලත් කලාකරුවන් වෙතින් නිසි පරිදි සම්පූර්ණ කර ලබාගත් අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය සහිතව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය.

අනුෂා ගෝකුල ප්‍රනාන්දු,
සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
8 වන මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

දුරකථන අංක : 0112-2872031, 011-2882592

ඇමුණුම 01

**සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

***කලාකරු දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා බඳවා ගැනීමේ අයදුම් පත්‍රය***

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :- ..................................................

.................................................. මයා/මිය/මෙනවිය

02. (I) මුලකුරු වලින් හැඳින්වෙන නම (සිංහලෙන්) : ..................................................

(II) අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) : ..................................................

03. අයදුම්කරුගේ ලිපිනය : ..................................................

04. උපන් දිනය : වර්ෂය : .................................. මාසය : .............................. දිනය : ..................................................

05. වයස (2016.11.15 දිනට) : අවුරුදු : .................................... මාස : ............................ දින : ..................................

06. උප්පැන්න සහතිකයේ අංකය හා ලියාපදිංචි කළ දිනය : ..................................................

07. හැඳුනුම්පත් අංකය : .......................................... හැඳුනුම්පත නිකුත් කළ දිනය : ..................................................

08. දිස්ත්‍රික්කය : ..................................................

09. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..................................................

10. අයදුම්කරුගේ කලා ක්ෂේත්‍රය : ..................................................

..................................................

11. අයදුම්කරුගේ වෙනත් කලා ක්ෂේත්‍ර : ..................................................

12. අයදුම්කරුගේ රැකියාව : ..................................................

13. අයදුම්කරුගේ මාසික ආදායම : ..................................................

14. අයදුම්කරුට රජයෙන් ලැබෙන වෙනත් දීමනා ඇත්නම් සඳහන් කරන්න : ..................................................

15. විවාහක/අවිවාහක බව : ..................................................

16. කලත්‍රයා පිළිබඳ විස්තර : ...............................................................................................................

(I) කලත්‍රයාගේ නම : ...............................................................................................................

(II) කලත්‍රයාගේ උපන් දිනය : ...............................................................................................

(III) කලත්‍රයාගේ හැඳුනුම්පත් අංකය : ...............................................................................

(IV) කලත්‍රයාගේ රැකියාව : ...............................................................................................

(V) කලත්‍රයාගේ මාසික ආදායම : .......................................................................................

17. දරුවන් පිළිබඳ විස්තර :

| *නම* | *උපන් දිනය* | *වයස (2016.11.15 දිනට)* | *රැකියාව* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනුම ප්‍රකාරව සත්‍ය හා නිවැරදි බවත්, මා දැනට රජය හෝ පෞද්ගලික අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන වෙනත් විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් නොලබන බවත් මෙයින් සහතික කරමි.

.........................................................

අයදුම්කරුගේ අත්සන.

***ප්‍රාදේශීය/ දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරීගේ සටහන***

අයදුම්කරු මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ස්ථිර/තාවකාලික පදිංචි අයෙකි. ඔහු/ඇය වසර............ක සිට කලා කටයුතුවල නියැලුනු/නියැලෙන කලාකරුවෙකි. ඉහත සඳහන් කර ඇති තොරතුරු පරීක්ෂා කළෙමි. ඔහු/ඇය වෙනත් රජයේ විශ්‍රාම වැටුපක් නොලබන අතර, ඔහු/ඇය කලාකරුවන් සඳහා වන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා දායකත්වය ඉල්ලා ඉදිරිපත් කරන ලද අයදුම්පත අදාල සුදුසුකම් සපුරා ඇතිබව සහතික කරමි.

.........................................................,

සංස්කෘතික නිලධාරි.

දිනය : ...................................................

***ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය :***

කලාකරු දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා ඉදිරිපත් කර ඇති මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති සුදුසුකම්වල නිවැරදිභාවය පරීක්ෂා කළෙමි. මෙම අයදුම්පත නිර්දේශ කරමි.

.........................................................,

ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් ලේකම්.

දිනය : ...................................................

*සැ.යු.*- සෑම අයදුම්පතක් සමගම කලාකරුවාගේ ප්‍රායෝගික කලා කටයුතු හඳුනාගැනීමට හැකිවන පරිදි ලිඛිත සාක්ෂි වශයෙන් සැලකීමට හැකි ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා තිබිය යුතුය. මේ සඳහා කලාකරුවාගේ නියෝජනය දැක්වෙන සහතිකපත්, තහවුරු කිරීමේ ලිපි, සම්මාන පිළිබඳ තොරතුරු සමරු කලාප පිටුවල ඡායා පිටපත්, ඡායාරූප, ඇගයීමේ ලිපි, සේවා සහතික, පුවත්පත් වාර්තා සහ වෙනත් ලේඛන ඉදිරිපත් කළ හැකිය. කිසිදු ලිපියක හෝ ලේඛනයක මුල් පිටපත් එවිය යුතු නොවේ. ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික්ක ලේකම් මගින් සහතික කරන ලද ඡායාපිටපත් පමණක් සැපයීම ප්‍රමාණවත් වේ.

මේ සමඟ පහත ලියවිලි අමුණා තිබිය යුතුය.

* උප්පැන්න සහතිකයේ සහතික කළ ඡායා පිටපතක්

* ජාතික හැඳුනුම්පතෙහි සහතක කළ ඡායා පිටපතක්

ඇමුණුම 02

**ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය**

"සුරැකුම" විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

| වයස අවුරුදු | මාසික විශ්‍රාම වැටුප (රු.) | මාසික වාරික මුදල (රු.) | මාසික වාරික සංඛ්‍යාව | ත්‍රෛමාසික වාරික මුදල (රු.) | ත්‍රෛමාසික වාරික සංඛ්‍යාව | වසර 25ක් තුළදී වාර්ෂික වාරික 25කින් (රු.) | වසර 20ක් තුළදී වාර්ෂික වාරික 20කින් (රු.) | වසර 15ක් තුළදී වාර්ෂික වාරික 15කින් (රු.) | වසර 10ක් තුළදී වාර්ෂික වාරික 10කින් (රු.) | වසර 05ක් තුළදී වාර්ෂික වාරික 05කින් (රු.) | එකවර ගෙවන්නේ නම් මුදල (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 23 | 1000 | 50 | 444 | 150 | 148 | 625 | 650 | 725 | 875 | 1425 | 5800 |
| 24 | 1000 | 60 | 432 | 170 | 144 | 675 | 700 | 775 | 975 | 1550 | 6300 |
| 25 | 1000 | 60 | 420 | 180 | 140 | 725 | 775 | 850 | 1050 | 1700 | 6900 |
| 26 | 1000 | 70 | 408 | 200 | 136 | 800 | 850 | 925 | 1150 | 1850 | 7500 |
| 27 | 1000 | 80 | 396 | 220 | 132 | 875 | 925 | 1025 | 1250 | 2025 | 8200 |
| 28 | 1000 | 80 | 384 | 240 | 128 | 950 | 1000 | 1100 | 1375 | 2200 | 8900 |
| 29 | 1000 | 90 | 372 | 260 | 124 | 1025 | 1100 | 1200 | 1475 | 2400 | 9700 |
| 30 | 1000 | 100 | 360 | 290 | 120 | 1125 | 1200 | 1325 | 1625 | 2625 | 10600 |
| 31 | 1000 | 100 | 348 | 300 | 116 | 1225 | 1200 | 1450 | 1775 | 2850 | 11600 |
| 32 | 1000 | 110 | 336 | 330 | 112 | 1350 | 1425 | 1575 | 1925 | 3125 | 12600 |
| 33 | 1000 | 130 | 324 | 370 | 108 | 1475 | 1550 | 1700 | 2100 | 3400 | 13800 |
| 34 | 1000 | 140 | 312 | 400 | 104 | 1600 | 1675 | 1875 | 2300 | 3700 | 15000 |
| 35 | 1000 | 150 | 300 | 450 | 100 | 1750 | 1850 | 2025 | 2500 | 4050 | 16400 |
| 36 | 1000 | 170 | 288 | 490 | 96 | | 2000 | 2255 | 2750 | 4425 | 17900 |
| 37 | 1000 | 190 | 276 | 550 | 92 | | 2200 | 2425 | 3000 | 4825 | 19500 |
| 38 | 1000 | 210 | 264 | 610 | 88 | | 2400 | 2650 | 3275 | 5275 | 21300 |
| 39 | 1000 | 230 | 252 | 680 | 84 | | 2625 | 2900 | 3575 | 5750 | 23300 |
| 40 | 1000 | 260 | 240 | 750 | 80 | | 2875 | 3175 | 3900 | 6275 | 25400 |
| 41 | 1000 | 290 | 228 | 840 | 76 | | | 3475 | 4250 | 6875 | 27800 |
| 42 | 1000 | 320 | 216 | 940 | 72 | | | 3800 | 4650 | 7500 | 30300 |
| 43 | 1000 | 360 | 204 | 1060 | 68 | | | 4175 | 5100 | 8200 | 33100 |
| 44 | 1000 | 400 | 192 | 1190 | 64 | | | 4575 | 5575 | 8975 | 36200 |
| 45 | 1000 | 440 | 180 | 1290 | 60 | | | 5000 | 6100 | 9800 | 39600 |
| 46 | 1000 | 500 | 168 | 1470 | 56 | | | | 6700 | 10750 | 43300 |
| 47 | 1000 | 500 | 156 | 1470 | 52 | | | | 6700 | 10750 | 43300 |
| 48 | 1000 | 570 | 144 | 1680 | 48 | | | | 7325 | 11750 | 47400 |
| 49 | 1000 | 650 | 132 | 1940 | 44 | | | | 8050 | 12875 | 51800 |
| 50 | 1000 | 760 | 120 | 2250 | 40 | | | | 8825 | 14125 | 56800 |
| 51 | 1000 | 810 | 108 | 2410 | 36 | | | | | 15475 | 62200 |
| 52 | 1000 | 960 | 96 | 2860 | 32 | | | | | 16975 | 68200 |
| 53 | 1000 | 1160 | 84 | 3450 | 28 | | | | | 18650 | 74800 |
| 54 | 1000 | 1430 | 72 | 4240 | 24 | | | | | 20500 | 82000 |
| 55 | 1000 | 1800 | 60 | 5350 | 20 | | | | | 22550 | 90100 |

රු. 1000/= විශ්‍රාම වැටුපකට අදළ තොරතුරු ඉහත දක්වා ඇති අතර, ඔබගේ කැමැත්ත හා හැකියාව අනුව රු. 3000/= ක අවම විශ්‍රාම වැටුපකට යටත්ව ඔබට අවශ්‍ය විශ්‍රාම වැටුපක් ලබා ගත හැක.

ඇමුණුම 03

**අබලතාවය හා මරණය සිදු වූ විට ගෙවීම් සිදු කිරීමේ ක්‍රමවේදය**

| *I වැනි තීරය* | *II වැනි තීරය* | *III වැනි තීරය* | *IV වැනි තීරය* | *V වැනි තීරය* |
|---|---|---|---|---|
| *යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේදී උපන් දිනයට වයස (අවුරුදුවලින්)* | *අබලතාවය හෝ මරණය සිදු වන විට වයස* | *ස්ථිර වශයෙන් පූර්ණ අබාධිත තත්ත්වයක් ඇති වූ අවස්ථාවක එකවර ගෙවන පාරිතෝෂිකය* | *ස්ථිර වශයෙන් අර්ධ අබාධිත තත්ත්වයක් ඇති වූ අවස්ථාවක එකවර ගෙවන පාරිතෝෂිකය* | *මරණය සිදු වූ අවස්ථා වක එකවර ගෙවන පාරිතෝෂිකය* |
| | *අබලතාවය හෝ මරණය සිදුවන අවස්ථාවේ ඊළඟ උපන් දිනයට වයස* | *රු. ශත* | *රු. ශත.* | *රු. ශත* |
| 18 සිට 54 දක්වා | 18 සිට 33 දක්වා | 50,000.00 | 25,000.00 | 25,000.00 |
| | 34 සිට 43 දක්වා | 40,000.00 | 20,000.00 | 20,000.00 |
| | 44 සිට 51 දක්වා | 30,000.00 | 15,000.00 | 15,000.00 |
| | 52 සිට 56 දක්වා | 20,000.00 | 10,000.00 | 10,000.00 |
| | 57 සිට 60 දක්වා | 16,000.00 | 8,000.00 | 8,000.00 |
| 55 සිට 59 දක්වා | සාමාජිකත්වය ප්‍රදානය කළ දිනයේ සිට දායක මුදල් ගෙවීමේ කාල සීමාවේ අවසානය දක්වා වූ කාල සීමාව තුළ | 12,000.00 | 6,000.00 | 6,000.00 |

12 - 76

---

**2016/2017 මහ කන්න රැස්වීම් තීරණ - අඹේවෙල ව්‍යාපාරය**

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඹේවෙල ව්‍යාපාරයේ 2016/2017 මහ කන්නය සඳහා කන්න රැස්වීම 2016.11.10 වැනි දින අඹේවෙල වාරිමාර්ග ඒකක කාර්යාලයේ දී පවත්වන ලද අතර එහි දී පහත තීරණ ගන්නා ලදී.

1. වගා කරන බිම් ප්‍රමාණය - අක්කර 940
2. වගා කරන බෝගය - වී සහ මිශ්‍ර එළවළු
3. ඇල වේලි ශුද්ධ කිරීමේ අවසන් දිනය - 2016.11.01 සිට 20 වැනි දින දක්වා
4. පළමු ජල මුරය නිකුත් කිරීම - 2016.11.21
5. බිම් සකස්කර අවසන් කරන දිනය - 2016.12.03
6. දෙවන වර ඇල වේලි ශුද්ධ කිරීම - 2017.02.05
7. අවසන් ජල මුරය නිකුත් කිරීම - 2017.04.15
8. අස්වනු නෙළා අවසන් කළ යුතු දිනය - 2017.05.01
9. ඇල වේලි ශුද්ධ නොකරන අයට දඩ මුදල - මීටර් 10කට රු. 1,000
10. අවශ්‍යතාවය අනුව මුර ජල ක්‍රමය ක්‍රියාත්මක වේ.

12 - 122

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

අබේසිංහ මුදියන්සේලාගේ ජයන්ත අබේසිංහ.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016.09.26 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසිද්ධ නොතාරිස් පනාවලගේ නිලන්ති බර්නඩෙත් පෙරේරා විසින් සහතික කරන ලද අංක 10489 සහ 2014.08.19 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය, බන්ධනදායි/උකස්කරු වශයෙන් ක්‍රියාකරමින් එකී අබේසිංහ මුදියන්සේලාගේ ජයන්ත අබේසිංහ යන අය විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා එකී අබේසිංහ මුදියන්සේලාගේ ජයන්ත අබේසිංහ යන අය විසින් ඇපයක් වශයෙන් කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද ඉහත කී පහසුකම් මත අයවිය යුතු ගෙවීම් ගෙවා පියවා දැමීම එකී අබේසිංහ මුදියන්සේලාගේ ජයන්ත අබේසිංහ යන අය විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද,

එකී වාර ණය පහසුකම මත 2016.01.13 වැනි දිනට අයවිය යුතු රුපියල් පනස්එක්ලක්ෂ තිස්හතරදහස් අටසිය පහකුත් ශත හැටහයක (රු. 51,34,805,66) මුදල සහ 2016.01.13 වැනි දිනට හිඟ මුල් මුදල වන රුපියල් හතලිස්හත්ලක්ෂ තිස්දහස් හාරසිය දහසයකුත් ශත අනූ එකක (රු. 47,30,416.91) මුදල මත එකඟ වූ පරිදි 2016.01.14 වැනි දින සිට තවදුරටත් පොළියද, තවද, සම්බන්ධිත ගාස්තු, ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් යම් ගාස්තු ප්‍රමාණයන්ද, තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වේතොත්) එම මුදල අඩුකොට අය කර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි ත්‍රිවංක සී.සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, උඩුකහ කෝරලයේ, වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය සභා සීමාවේ, අංක 871 දරන උතුරු මඩවල ග්‍රාම නිලධාරී වසමේ මඩවල ගමේ පිහිටි මඩවල එස්ටේට් නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්.එම්. දිසානායක විසින් මැන සාදන ලද අංක 3209 සහ 2010.07.25 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබැලි අංක 1 දරන බිම් කොටසට (බලයලත් මිනින්දෝරු එස්.එම්.දිසානායක විසින් මඩවල එස්ටේට් නැමැති ඉඩමට මැන සාදන ලද අංක 2108 A සහ 2001.02.10 වැනි දින දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1 සහ කැබලි අංක 5 දරන ඉඩම් කැබලිවල ඒකාබද්ධ කිරීමක් වන) මායිම්, උතුරට : කුරුණෑගල-මඩවල ප්‍රධාන පාර ද, නැගෙනහිරට : අංක 2108A දරන එකී පිඹුරේ නිරූපිත කැබලි අංක 4 (පාර) ද, දකුණට : එකී අංක 2108A දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 6 ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එච්.බී.අබේරත්න විසින් මැන සාදන ලද අංක 587 A දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 2 A සහ කැබලි අංක 5 ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 3209 දරන පිඹුර අනුව පර්චස් තිහක් (අ. 0, රූ. 0, පර්. 30) විශාල බිම් කැබැල්ලය. මෙම දේපළ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ V 01/111 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242,
යූනියන් පෙදෙස,
කොළඹ 02.

12 - 98

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

දහනායක ලියනගේ නිහාල් සමන්.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016.09.26 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසිද්ධ නොතාරිස් ඉෂාරා දිලුමිනි වීරක්කොඩි විසින් සහතික කරන ලද අංක 2421 සහ 2015.01.02 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් , දේපළ සහ පරිශ්‍රය, බන්ධනදායි /උකස්කරු වශයෙන් ක්‍රියාකරමින් එකී දහනායක ලියනගේ නිහාල් සමන් යන අය විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී දහනායක ලියනගේ නිහාල් සමන් යන අය විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද ඉහත කී පහසුකම් මත අයවිය යුතු ගෙවීම් ගෙවා පියවා දැමීම එකී දහනායක ලියනගේ නිහාල් සමන් යන අය විසින් පැහැර හැරීම කර ඇති බැවින්ද,

එකී වාර ණය පහසුකම මත 2016.07.21 වැනි දිනට අයවිය යුතු රුපියල් හැටපන්ලක්ෂ විසිතුන්දහස් දෙසියයදහහතරකුත් ශත තිස් නවයක (රු. 6,523,214.39) මුදල සහ 2016.07.21 වැනි දිනට හිඟ මුල් මුදල වන රුපියල් හැටලක්ෂ විසිදහස් පන්සියවිසිහයකුත් ශත දෙකක (රු. 6,020,526.02) මුදල මත එකඟ වූ පරිදි 2016.07.22 වැනි දින සිට තවදුරටත් පොළියද, තවද, සම්බන්ධිත ගාස්තු, ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් යම් ගාස්තු ප්‍රමාණයන්ද, තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි ත්‍රිවංක සී.සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම නගර සභා සීමාව තුළ, (මහරගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අංක 528 A දරන දඹහේන ග්‍රාම නිලධාරී වසමේ) සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, පන්නිපිටිය ගමේ පිහිටි තල්ගහලන්දවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්.ඒ.ඩබ්ලිව්. පෙරේරා විසින් මැන සාදන ලද අංක 648 සහ 2003.06.03 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 01 දරන බිම් කොටසට මායිම් උතුරට : එම්.ඩී.ජේ.විලියම් යන අය විසින් හිමිකම් කියන තල්ගහලන්දවත්ත නැමැති ඉඩම (අංක 1420 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක (02) ද, නැගෙනහිරට : කලින් ඩී.ඒ. විජේසේකර යන අය හිමිකම් කියන ලද වර්තමානයේදී කේ.වී. නිහාල් දේවප්‍රිය හිමිකම් කියන ඉඩම ද, දකුණට : එච්, බී. ජී. උපසිරි හිමිකම් කියන තල්ගහලන්දවත්ත නැමැති ඉඩම (අංක 1429 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක (02) ද, බස්නාහිරට : රණවිරු අතුල මාවත ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 648 දරන පිඹුර අනුව පර්චස් දහසයයි දශම නවයයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 16.90) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, පලතුරු ආදී සෑම සියලු දේත් සමගය.

ඉහත කැබැලි අංක 01 වනාහී පහත විස්තර කරන ඉඩමේ නැවත මැන බෙදීමක් වේ.

ඉහත කී පන්නිපිටිය ගමේ පිහිටි තල්ගහලන්දවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී.ජේ.නානායක්කාර විසින් මැන සාදන ලද අංක 1429 සහ 1969.06.20 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 03 දරන බිම් කොටසට මායිම් උතුරට : කැබලි අංක 02 ද, නැගෙනහිරට : ජී.ඩී.ඒ. විජේසේකර යන අයගේ ඉඩම ද , දකුණට : කැබලි අංක 04 ද , බස්නාහිරට : කැබලි අංක A ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1429 දරන පිඹුර අනුව පර්චස් පහළොවක් (අ. 0,රූ. 0, පර්. 15) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, පලතුරු ආදී සෑම සියලු දේත් සමගය. මෙම දේපල දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 134/118 දරන වෙළුමේ / පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

තවද, ඉහත කී ඉඩමට මෙහි පහත විස්තර කරන ඉඩමේ මාර්ග අයිතිය ද සමගය.

ඉහත කී පන්නිපිටිය ගමේ පිහිටි තල්ගහලන්දවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී.ජේ. නානායක්කාර විසින් මැන සාදන ලද අංක 1429 සහ 1969.06.20 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක A දරන බිම් කොටසට (පාර සඳහා වෙන් කිරීමට) මායිම් උතුරට : පන්සල පාර ද, නැගෙනහිරට : කැබලි අංක 01 සිට 04 ද, දකුණට : කැබලි අංක 05 ද, බස්නාහිරට : මුණසිංහ යන අයගේ ඉඩම ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1429 දරන පිඹුර අනුව පර්චස් තිස් එකක් (අ. 0, රූ. 0, පර්. 31) විශාල බිම් කැබැල්ලය. මෙම දේපළ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 56/44 දරන වෙළුමේ / පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242,
යූනියන් පෙදෙස,
කොළඹ 02.

12 - 99

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංක පී.කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 635790.
තුසේ පෙරේරා ලියනරාලලාගේ අමල් ප්‍රියන්ත.

2016 ඔක්තෝබර් 28 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් R. A. M. N. රාජසූරිය විසින් 2010 ජූලි මස 23 වැනි දින සහතික කරන ලද අංක 347 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි නමට ලියනලද්දාවූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම තුසේ පෙරේරා ලියනරාලලාගේ අමල් ප්‍රියන්ත ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හතලිස් හත්ලක්ෂ හැටඑක්දහස් හාරසිය හතලිස් දෙකයි ශත හතලිස් තුන (රු. 4,761,442.43)ක මුදලක් 2016 අගෝස්තු මස 31 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් හතලිස් හත්ලක්ෂ හැට එක්දහස් හාරසිය හතලිස් දෙකයි ශත හතලිස් තුන (රු.4,761,442.43)ක මුදල අයකර ගැනීම සඳහා සහ 2016 සැප්තැම්බර් මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 4,062,509.59 ක මුදල මත 13.50% ක වැඩිදුර වාර්ෂික පොලිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ

යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 347 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කොට ඇත්තාවූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපල සහ පරිශ්‍ර කොළඹ 12 හල්ස්ඩ්‍රෝෆ් වීදියේ 2 වන මහලේ අංක 200 දරන ස්ථානයේ පිහිටි හි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු එල්.බී.සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කොරලේ පල්ලේ පත්තුවේ කටුවාවල හි පිහිටි "ඇටඹගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු J. ද සිල්වා විසින් 1991 ජූලි මස 07 වැනි දින මැන සාදන ලද අංක 1210 දරන පිඹුරේ ලොට් A වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : බලයලත් මිනින්දෝරු K. R. P. පෙරේරා විසින් 1964 ජූනි මස 27 වැනි දින මැන සාදන ලද අංක 791 දරන පිඹුරේ ලොට් 11 සහ 7 ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු K. R. P. පෙරේරා විසින් 1964 ජූනි මස 27 වැනි දින මැන සාදන ලද අංක 791 දරන පිඹුරේ ලොට් 6 ද, දකුණට : ලොට් E න් ද සහ බස්නාහිරට : අංක 791 දරන පිඹුරේ ලොට් C සහ B සහ ලොට් 11 න්ද මායිම් වූ එකී අංක 1210 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහසයයි දශම පහයි අට (අ. 0, රූ. 0, පර්. 16.58)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි ගහකොළ වගවෙන් සහ එහි පිහිටි සියලුම දේත් සමග වන මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්ඉරු M 2892/220 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත විස්තර සඳහන් පාරක් වෙන්කිරීම මතුපිටින් හා ඒ තුල ගමන් කිරීමේ ඇති අයිතියද සමග වේ.

1 ඉහත සඳහන් කටුවාවල හි පිහිටි "ඇටඹගහවත්ත" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු J ද සිල්වා විසින් 1991 ජූලි මස 07 වැනි දින මැන සාදන ලද අංක 1210 දරන පිඹුරේ ලොට් C වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : ලොට් B න් ද, නැගෙනහිරට : ලොට් A න් ද දකුණට : ලොට් E සහ D න් ද සහ බස්නාහිරට : අඩි 10 ක් පළල පාරෙන් මායිම් වූ එකී අංක 1210 දරන පිඹුර ප්‍රකාරව පර්චස් බිංදුවයි තුනයි දශම බිංදුවයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 03.00)ක විශාලත්වයෙන් යුක්ත වන මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්ඉරු M 1855/224 යටතේ ලියාපදිංචි කර ඇත.

2 ඉහත සඳහන් කටුවාවල හි පිහිටි "ඇටඹගහවත්ත" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු K. R. P. පෙරේරා විසින් 1964 ජූලි මස 27 වැනි දින මැන සාදන ලද අංක 791 දරන පිඹුරේ ලොට් 15 (වෙන්කරන ලද අඩි 10ක් පළල පාර) වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : කරත්ත පාරෙන් ද, නැගෙනහිරට : ලොට් අංක 2,14,13,12,11 සහ 8 න් ද, දකුණට : ලොට් 9 න් ද සහ බස්නාහිරට : ලොට් අංක 10 සහ 11 න්ද මායිම් වූ එකී අංක 1210 දරන පිඹුර ප්‍රකාරව පර්චස් පහළොවයි දශම පහයි හතර (අ. 0, රූ. 0, පර්. 15.54)ක විශාලත්වයෙන් යුක්ත වන මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්ඉරු M 1628/268 යටතේ ලියාපදිංචි කර ඇත.

රංජනී ගමගේ මිය,
සමාගම් ලේකම්.

12 - 108

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

පී. රණසිංහ.
ගිණුම් අංක : 0090 5000 1005.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2016.10.27 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ.ජේ. බන්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2007 අගෝස්තු මස 31 දතම හා අංක 1497 දරන, 2009 සැප්තැම්බර් මස 25 දතම හා අංක 2425 දරන සහ 2010 අගෝස්තු මස 12 දතම හා අංක 2717 දරන, අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන ඒ.වී.ඒ. දිසානායක යන අය විසින් ලියා සහතික කරන ලද 2012 ජූලි මස 25 දතම හා අංක 7252 දරන, ඒ.ජී.කේ. ආලෝක බන්ඩාර යන අය විසින් විස්තර සහතික කරන ලද 2013 නොවැම්බර් මස 14 දතම හා අංක 105 සහ 2014 ඔක්තෝම්බර් මස 23 දතම හා අංක 310 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල අයතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රියන්ත රණසිංහ යන අය බන්ධනදයින් වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද, එකී අංක 1497, 2425, 2717, 7252, 105 සහ 310 දරන බැඳුම්කර ප්‍රකාර අයවියයුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් හතලිස් නම ලක්ෂ විසි පන් දහස් හයසිය හැට දෙකයි ශත විසි නමයක (රු. 4,925,662.29) මුදලක් 2016 ඔක්තෝම්බර් 03 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හතලිස් නම ලක්ෂ විසි පන් දහස් හයසිය හැට දෙකයි ශත විසි නමයක (රු. 4,925,662.29) මුදල ද, 2016 ඔක්තෝම්බර් 04 දින සිට අංක 1497, 2425, 2717, 7252, 105 සහ 310 දරන එකී බැඳුම්කර මත අයවියයුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හතලිස් හය ලක්ෂ තිස් දෙදහස් හාරසිය තිස් තුනයි ශත හතලිස් හතක (රු. 4,632,433.47) මුදලක් සඳහා වාර්ෂිකව සියයට එකොළහක් (11%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1497, 2425, 2717, 7252, 105 සහ 310 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිඅකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරි ඇති බලතල ප්‍රකාර, එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉනාමළුව කෝරළේ දඹුල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අංක 452 - E - කිඹිස්ස ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කිඹිස්ස ග්‍රාමයේ පිහිටි "අලුත්ගෙදර වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ.එම්. අනුරරත්න යන අය විසින් සාදන ලද 2004 සැප්තැම්බර් 12 දතම හා අංක 2520 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කලින් ඒ.එම්. කිරිබන්ඩාගේ දූන් මාලනී අශෝකා ගමගේ යන අයගේ ඉඩම, නැගෙනහිරට : කිඹිස්ස සිට දිගම්පතන දක්වා පාර (ගම් සභා), දකුණට : කලින් යූ. රන්නාහිගේ දූන් යූ. ජී. ඩිංගිරිඅම්මා යන අයගේ ඉඩම සහ බස්නාහිරට : රජයේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිහක් (A. 0, R. 1, P.30) හෝ හෙක්ටයාර 0.1770 විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ මාර්ග අයිතින් ද, වෙනත් අයිතින් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2520 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව L 25/94 යටතේ මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12 - 148

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එච්.එම්.එන්. හේරත් සහ එම්.එච්.පී. මද්දුමගේ.
ගිණුම් අංක : 0145 5000 2656.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2016.09.29 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ.ඒ.පී. කහඳව යන අය විසින් ලියා සහතික කරන ලද 2014 ජූලි මස 09 දතම හා අංක 881 දරන හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජී.එන්.එම්. කෝදගොඩ යන අය විසින් ලියා සහතික කරන ලද 2015 නොවැම්බර් මස 18 දතම හා අංක 1799 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල බදුකර අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මද්දුමගේ හංසවිකා ප්‍රසාදිනී මද්දුමගේ සහ හේරත් මුදියන්සේලාගේ නිහාල් හේරත් යන අය බන්ධනදයින් වශයෙන් හා එකී මද්දුමගේ හංසවිකා ප්‍රසාදිනී මද්දුමගේ යන අය උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 881 සහ 1799 දරන බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් එක්කෝටි අසූ තුන් ලක්ෂ හයසිය තිස් නමයයි ශත තුනක (රු. 1,83,00,639.03) මුදලක් 2016 අගෝස්තු මස 18 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එක්කෝටි අසූ තුන් ලක්ෂ හයසිය තිස් නමයයි ශත තුනක (රු. 1,83,00,639.03) මුදල ද, 2016 අගෝස්තු මස 19 වැනි දින සිට අංක 881 සහ 1799 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි හතළිස් හත් ලක්ෂ හතළිස් නම දහස් හාරසිය එකොළහයි ශත හතක (රු. 1,47,49,411.07) මුදලක් සඳහා at the rate of Average weighted Prime Lending Rate + වාර්ෂිකව සියයට දෙකක් (2%) Floor rate වාර්ෂිකව සියයට දහයක් (10%) හා තවත් රුපියල් විසිතුන් ලක්ෂ හැට නම දහස් නමසිය හැට නමයයි ශත හතළිස් එකක (රු. 23,69,969.41) මුදලක් සඳහා at the rate of Average weighted Prime Lending Rate + වාර්ෂිකව සියයට තුනයි දශම පහක් (3.5%) Floor rate වාර්ෂිකව සියයට දහයයි දශම පහක් (10.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 881 සහ 1799 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී.කේ.ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර, එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පානදුර තොටමුණේ තල්පිටි දෙබැද්ද පානදුර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දිබ්බැද්ද උතුර 693A ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දිබ්බැද්ද ග්‍රාමයේ පිහිටි "බුළුගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්.එම්.ඩී. කුරේ යන අය විසින් සාදන ලද 2010 ඔක්තෝබර් 26 දතම හා අංක 2343 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර, නැගෙනහිරට : ලොට් 2, දකුණට : ඩබ්ලිව්. ඕ. ප්‍රනාන්දු යන අයගේ උරුමක්කාරයින් සහ ඩබ්ලිව්.ජේ. සොයිසා විසින් හිමිකම් කියනු ලබන දේපළ සහ බස්නාහිරට : අංක 7579 දරන පිඹුරේ ලොට් 4 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ නමයයි දශම එකක් (A. 0, R. 0, P.19.1) හෙක්ටයාර 0.04831 ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2343 දරන පිඹුරට අනුව ය.

2. එකී දිබ්බැද්ද ග්‍රාමයේ පිහිටි "බුළුගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්.එම්.ඩී. කුරේ යන අය විසින් සාදන ලද අංක 2343 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති

ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර, නැගෙනහිරට : පාර, දකුණට : ඩබ්ලිව්.ඕ. ප්‍රනාන්දුගේ උරුමක්කාරයින් විසින් හිමිකම් කියනු ලබන දේපළ සහ බස්නාහිරට : ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම නමයක් (0 A., 0. R., 10.9 P.)) හෙක්ටයාර 0.02757 ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 2343 දරන පිඹුරට අනුවය.

මෙම ඉඩමේ බෙදවෙන්කොට සීමා නිර්ණය කොට එකී බිම් කොටස් දෙක පහතින් විස්තර කොට ඇත.

එකී දිබ්බැද්ද ග්‍රාමයේ පිහිටි "බුළුගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්.එම්.ඩී. කුරේ යන අය විසින් සාදන ලද 2008 මාර්තු 10 දතම හා අංක 2113 දරන පිඹරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර, නැගෙනහිරට : පාර, දකුණට : ඩබ්ලිව්.ඕ. ප්‍රනාන්දු උරුමක්කාරයින් සහ ඩබ්ලිව්.ජේ. සොයිසා විසින් හිමිකම් කියනු ලබන දේපළ සහ බස්නාහිරට : අංක 7579 දරන පිඹුරේ ලොට් A මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහක් (0 A., 0 R., 30 P.) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 2113 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව D 72/97 යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12-150

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2016.09.21 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. එස්. සී. මැතිව් විසින් සහතික කරන ලද 2011.04.08 දිනැති අංක 5510 දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. අයි. පී. විජයවික්‍රම විසින් සහතික කරන ලද 2013.06.24 දිනැති අංක 158 දරන උකස් බැඳුම්කර මත 2016.08.08 වැන දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් හැත්තෑ නව ලක්ෂ දෙළොස්දහස් දෙසීය විසිහතරයි ශත තිස් දෙකක (රු. 7,912,224.32) මුදල සමග රුපියල් ලක්ෂ හැටක (රු. 6,000,000) මුදල ස්ථිර අයිරා මත වසරට සියයට දහහතර (14%) බැගින් ද 2016.08.09 වැනි දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් හතළිස්තුන් ලක්ෂ දහහතර දහස් නවසිය දහතුනයි ශත නවයක (රු. 4,314,913.09)ක මුදල සමග රුපියල් තිස්හතර ලක්ෂ හත්සිය තිස් නවයයි ශත තිස්පහක (රු. 3,400,739.35) ණය මුදල මත වසරකට සියයට දහතුනයි දශම පහ (13.5%) බැගින් 2016.08.09 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් පොළිය ද, පිළියන්දල, තුම්බෝවිල, බට්ටිය වත්ත පාරේ අංක 83/4හි ඇලෙක්සැන්ඩර් වේර්ක්ස් විපුල රංග කුමාර් යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. එස්. චාන්දනී මැතිව් විසින් සහතික කරන ලද 2011.04.08 දිනැති අංක 5510 දරන උකස් බැඳුම්කරය මත ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. අයි. පී. විජය වික්‍රම විසින් සහතික කරන ලද 2013.06.24 දිනැති අංක 158 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු රුපියල් හැත්තෑ නව ලක්ෂ දෙළොස්දහස් දෙසීය විසිහතරයි ශත තිස් දෙකක (රු. 7,912,224.32)ක මුදල සහ රුපියල් හතළිස්තුන් ලක්ෂ දහහතර දහස් නවසිය දහතුනයි ශත නවයක (රු. 4,314,913.09)ක මුදල සමග 2016.08.09 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතාට එකී ලංකා බැංකු ආඥපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, කෙළින් වීදිය ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ කැස්බෑව ලේකම් කොට්ඨාසයේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාවේ අංක 576A දරන උතුරු තුම්බෝවිල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි "මාරගහවත්ත" නැමති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ආර්. එස්. පෙරේරා විසින් සාදන ලද 2005.09.30 දිනැති අංක 2046 දරන පිඹුරෙහි ලොට් $A^{1a2}$ ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් $A^{1a2}$ උතුරට : අංක 1781 දරන පිඹුරෙහි ලොට් $A^{1a1}$ , $A^{1a3}$ සහ $A^{1b}$, නැගෙනහිරට : අංක 1781 දරන පිඹුරෙහි $A^{1b}$ සහ අංක 1852 දරන පිඹුරෙහි ලොට් $A^{2}$ ද, දකුණට : අංක 1852 දරන පිඹුරෙහි ලොට් $A^{2}$ සහ ඩබ්. ඩී. කරෝලිස්ගේ උරුමක්කාරයින්ට අයත් කහටගහවත්ත දෙනිය ද, බස්නාහිරට : ඩබ්. ඩී. කරෝලිස් ගේ උරුමක්කාරයින්ට අයත් කහටගහවත්ත දෙනිය ලොට් $A^{1a1}$ සහ $A^{1a3}$ ද මායිම්ව එ කී අංක 2046 දරන පිඹුරට අනුව පර්චස් හයයි දශම හයයි අටක (අ. 0, රූ. 0, පර්. 06.68)ක බිම් ප්‍රමාණයකින් යුක්ත වේ. මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 16/21හි ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

එකී තුම්බෝවිල පිහිටි "මාරගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ආර්. එස්. පෙරේරා විසින් සාදන ලද 2005.09.30 දිනැති අංක 2046 දරන පිඹුරෙහි ලොට් $A^{1a3}$ (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් $A^{1a3}$ උතුරට : බට්ටියාවත්ත පාර සහ අංක 1781 දරන පිඹුරෙහි ලොට් $A^{1b}$ ද, නැගෙනහිරට : අංක 1781 දරන පිඹුරෙහි ලොට් $A^{1b}$ සහ ලොට් $A^{1a2}$ ද, දකුණට : ලොට් $A^{1a2}$ සහ $A^{1a1}$ ද, බස්නාහිරට : ලොට් $A^{1a1}$ සහ බට්ටියාවත්ත පාර ද මායිම්ව එකී අංක 2046 දරන පිඹුරට අනුව පර්චස් එකයි දශම අටයි දෙකක (අ. 0, රූ. 0, පර්. 1.82)ක බිම් ප්‍රමාණයකින් යුක්ත වේ. මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 16/22හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එස්. එම්. එම්. පී. හේරත් මිය,
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී,

ලංකා බැංකුව,
කෙළින් වීදිය ශාඛාව.

12 - 200

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
# සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

**සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට *www. documents. gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.**

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. ගැසට් පත්‍රය නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. | |
|---|---|---|---|
| I වැනි කොටස : | | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 | |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 | |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 | |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 | |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 | |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 | |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 | |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 | |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 | |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

*** කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| මාසය | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2016 | | | |
| **දෙසැම්බර්** | 2016.12.02 | සිකුරාදා | 2016.11.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.12.09 | සිකුරාදා | 2016.11.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.12.16 | සිකුරාදා | 2016.12.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.12.23 | සිකුරාදා | 2016.12.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.12.30 | සිකුරාදා | 2016.12.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | 2017 | | | |
| **ජනවාරි** | 2017.01.06 | සිකුරාදා | 2016.12.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.01.13 | සිකුරාදා | 2016.12.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.01.20 | සිකුරාදා | 2017.01.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.01.27 | සිකුරාදා | 2017.01.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2017.02.03 | සිකුරාදා | 2017.01.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.02.09 | බ්‍රහස්පතින්දා | 2016.01.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.02.17 | සිකුරාදා | 2017.02.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.02.23 | බ්‍රහස්පතින්දා | 2017.02.09 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*).

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.